# කිඳුරු සිහිනය



එස්. එම්. අසලියා මන්දස්මි සමරතුංග

**කෘතියේ නම**

කිඳුරු සිහිනය (ළමා කතන්දර)

**කතෘ**

එස් එම් අසලියා මන්දස්මි සමරතුංග

5 ශ්‍රේණිය

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

**චිත්‍ර**

එස් එම් අසලියා මන්දස්මි සමරතුංග

**කතෘගේ වෙනත් කෘති**

දැන් අපි යාළුයි (ළමා කතන්දර 2020 දෙසැම්බර්)

වාසනා මල්ල (ළමා කතන්දර 2023 දෙසැම්බර්)

**කෘතිය පල කළ දිනය**

2025/02/08

**ISBN 978 - 624 - 208 - 247 - 9**

# පිදුම

සෙවනැල්ල සේ ළඟින් හිඳ දිරිය දෙන මිතුරිය

**අම්මාට**

නිහඬ සෙනෙහසින් දිවිය සරසන නොනිමෙන පහන් ටැඹ

**අප්පච්චීට**

මට ලොව ඇති ශක්තිමත්ම බැඳීම වූ **අයියාට**

හොවා ඇකයේ පොවා සිප්කිරි නිමක් නැති දැනුම් සයුරක් දුන්

**දයාබර ගුරු මව්වරුනට පියවරුනට**

මගේ මේ තෙවන වෑයම

උපහාරයක් වේවා !

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තළු යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එදා ඉතා සුන්දර සඳ රැස් විහිදී ඇති රාත්‍රියකි. විටෙක තරු නොපෙනී යයි නැවත සඳේ පාළුව මකමින් තරු පායයි. මේ සුන්දර රාත්‍රී අහස දෙස බලා සිටියේ පුංචි ගැහැනු ළමයෙකි. ඇයගේ නම ස්කලී ය.

ස්කලී ගොඩක් බුද්ධිමත් සහ ලස්සන අවුරුදු දහයක ඉතා ප්‍රීතිමත් ගැහැනු ළමයෙකි. ඇයගේ විනෝදාංශය වුයේ මුහුද සහ දියකිඳුරියන් ගැන අධ්‍යයනය කිරීමයි. ඇයගේ අම්මා සහ තාත්තා ඉන්ජිනේරුවරුන්ය. ඔවුහු ඉතා කාර්‍යය බහුලයි. ස්කලී සමඟ කාලය ගත කිරීමට කිසිම හැකියාවක් තිබුණේ නැහැ. ස්කලී මේ හේතුව නිසා නම් හිටියේ ඉතා දුකින්. ඇයගේ හැම දුකකදීම ළඟින්ම සිටියේ ඇයගේ පූසා පින්කි සහ බල්ලා ලකී ය. ඇය ඉගෙනුම ලැබුවේ ඇමරිකාවේ ටෙක්සාස් ප්‍රාන්තයේ සෙන් මිරකියුලා උසස් පාසලේ ය.

ස්කලීගේ පාසලේ නිවාඩු කාලය උදා වුණා. ස්කලීගේ යහළුවන් සියලු දෙනාම විනෝද චාරිකා යාම ආරම්භ



කළා. වෙනදා වගේම මෙදා පාරත් ගෙදරම ඉන්න වෙයි කියලා ස්කලී හිතුවා. ඒත් එයා පුරුද්දට වගේ අම්මාගෙන් ඇහුවා, අපි මේ නිවාඩුවට කොහේ හරි යන්නේ නැද්ද කියලා.

"අපිට මුහුදු වෙරළකට යන්න පුළුවන් වෙයි"  අම්මා කිව්වා. ස්කලීට හිතාගන්න බැරිවුණා. ස්කලී සතුටින් කෑගසමින් ඇසුවේ පින්කිට සහ ලකීටත් යන්න පුළුවන්ද?  කියලා. "අනිවාර්යයෙන්ම" අම්මා කිව්වා. "අපි කවදා ද ඒ ගමන යන්නේ" ස්කලී ඇසුවා. "අනිද්දාට" අම්මා කිව්වා.

ස්කලී ඉක්මනින් ගිහින් ගමනට අවශ්‍යය බඩු සූදානම් කර ගත්තා. පූසාට සහ බල්ලාට ස්කලී මේ ගැන කිව්වා. ඒ දෙන්නත් ස්කලී සතුටින් නිසා සතුටු වුණා. එයාලටත් ස්කලී කියන දේවල් තේරෙනවා.

චාරිකාව යන දවස උදාවුණා. ස්කලී උදෙන්ම අවදි වුණා. ගමන යාමට සූදානම් වුණා. සියලුදෙනාම ගමන පිටත්වුණා.

යන ගමන් ස්කලී තාත්තාගෙන් මේවගේ ප්‍රශ්න ඇසුවා.

" තාත්තා එහෙ දියකිඳුරියෝ ඉන්නවාද"? "හිටියොත් මට බලන්න යන්න පුළුවන්ද"? " අපිට මුහුදේ ඈතට යන්න පුළුවන්ද"?

"මම දන්නේ නැහැ, අපි බලමු" තාත්තා සිනාසෙමින් කිව්වා. ස්කලී එම ප්‍රදේශයේ දියකිඳුරියන් පිළිබඳව අන්තර්ජාලයෙන් සොයා බැලුවා. එහි සඳහන්වූයේ, සඳ සම්පූර්ණයෙන් පායන දිනවල කිඳුරියන් වෙරළ ආසන්නයට පැමිණෙන බවයි. ස්කලීට මේක දැකලා හරියට සතුටු හිතුණා.

සවස් වන විට හැමෝම ගමනාන්තයට ළගාවුණා. ස්කලී දැක්කේ ඉතාම සුන්දර පරිසරයක් පෙණ කැටි නංවමින් මුහුදු රළ නැඟ බැස යන දර්ශනයෙන් ස්කලීට ඇස් අහකට ගැනීමට සිතුනේ නැහැ.

"මේ තියෙන්නේ අපි නවතින තැන" සුදු පැහැයෙන් පින්තාරු කර ඇති කුඩා නිවසක් පෙන්වමින් තාත්තා කිව්වා.

ස්කලී හැමෝටම කලින් කාරයෙන් බැස පින්කී සහ ලකී සමගින් මුහුද අසලට දිවගියා. ස්කලී මුහුදට

පනින්න සූදානම් වන බව දුටු මව " දැන් සවස් වෙලා වැඩියි, මුහුදේ සැඩ පහරක් සැර වැඩියි, හෙට මුහුදට යමු" කියලා කිව්වා.

"එන්න අපි අපේ නවතින තැන බලමු" තාත්තා කිව්වා. " යමු ඔයාගේ නිදන කාමරය පෙන්නන්න" අම්මා නැවත කිව්වා.

එය ස්කලීගේ නිවසේ නිදන කාමරයට වඩා පොඩි වුනාට ඇය එයට බොහෝ කැමතිවුණා. ස්කලීගේ කාමරයේ ජනේලයෙන් මුහුද ලස්සනට පෙණුනා.

ඊ ළග දවස උදාවුණා. ස්කලී උදෙන්ම පින්කී සහ ලකී සමග මුහුදු වෙරළට ගියා. මුහුදේ ලස්සන දුටු ස්කලීට අම්මාට සහ තාත්තාට මෙම දර්ශනය පෙන්වීමට සිතා නිවසට දිව ගියා. " අම්මා තාත්තා බලන්නකෝ මුහුදේ ලස්සන එන්න එළියට" කියමින් කෑගැසුවා.

"දැන්නම් එන්න වෙන්නේ නැහැ මට කාර්යාලයේ හදිසි වැඩ වගයක් කරන්න තියෙනවා" අම්මා කිව්වා. "මටත් අලුත් ව්‍යාපෘතියක සැලැස්මක් අඳින්න තියෙනවා"

තාත්තා කිව්වා.

"ඔයා පින්කී ලකී එක්ක සෙල්ලම් කරන්න වැඩිය ඈතට යන්න එපා අපි පස්සේ එන්නම් අම්මා නැවත කිව්වා.

ස්කලීට හරියට දුක හිතුණා. නිවාඩුවකට ආවත් දෙමව්පියන් නැවත සුපුරුදු ලෙස කාර්‍යය බහුලව සිටියා.

ඇය මුහුදු වෙරළට ගොස් සිප්පි කටු ගල් කැට මුහුදට විසි කරමින් සිටියා. තමාගේ ඉදිරියෙන් සෙවනැල්ලක් වැටී තියෙනවා දැකපු ස්කලී ඉක්මනින් පිටුපස බැලුවා. ඇය දුටුවේ අප්‍රිකානු හුරුවක් ඇති කුඩා පිරිමි ළමයෙකි.

"ඔයා කවුද" ? ස්කලී ඇසුවා.

"මම ක්ලයි මම ජීවත් වෙන්නේ අර ඈත පේන පුංචි ගෙදර" ක්ලයි කීව්වා.

"කොහොමද ක්ලයි මම ස්කලී හමුවීම සතුටක්" ස්කලී සතුටින් කිව්වා.

"ඔයා නිවාඩුවටද මෙහෙට ආවේ" ක්ලයි ඇසුවා.

"ඔව්" ස්කලී පිළිතුරු දුන්නා. "එහෙනම් ඇයි ඔයා දුකින් ඉන්නේ මම ගොඩක් වෙලා ඔයා දිහා බලන් හිටියා" ක්ලයි කිව්වා.

"මට හරිම පාළුයි, තනියයි අම්මටයි තාත්තටයි මාත් එක්ක ඉන්න වෙලාවක් නැහැ, මම ආසයි මුහුදට ගිහින් දියකිඳුරියෝ බලන්න" ස්කලී කිව්වා.

"ඔයා දියකිඳුරියෝ ඉන්නවා කියලා විශ්වාස කරනවාද?" ක්ලයි පුදුමයෙන් ඇසුවා.

" ඔව් ඇයි ඔයා එහෙම අහන්නනේ" ස්කලී කුතුහලයෙන් ඇසුවා.

"මම දියකිඳුරියක් දැකලා තියෙනවා, හැබැයි කවුරුවත් මාව විශ්වාස කළේ නැහැ" ක්ලයි කිව්වා.

"මම ඔයාව විශ්වාස කරනවා. ඔයා කොහේදිද එයාලව දැක්කේ මට ඒ ගැන කියන්න" ස්කලී කලබලයේ ඇසුවා.

ඔයාට පේනවද අර ඈත තියෙන ගල්පරය, එතනදි තමයි මම කිදුරියක් දැක්කේ එතන  පොඩි දූපතක් තියෙනවා පේනවද?

"මම එක දවසක් කිමිදෙන්න ආව මහත්තුරු කට්ටියක් එක්ක අත්උදවුවට ඒ දූපතට ගියා. එදා ලස්සනට හඳ පායලා තිබුණා. ගොඩක් රෑවුණ නිසා අපි ඒ දූපතේ නැවතුනා. මම කම්මැලි නිසා රෑ මුහුදු වෙරළට ගියා. එක පාරටම මම ඒ ගල් පරය උඩ දියකිඳුරියක් ඉන්නවා දැක්කා. මම හයියෙන් මෙන්න දියකිඳුරියක් කියලා කෑගැහුවා. මගේ සද්දෙට දියකිඳුරී මුහුදට පැන්නා. මට එයාව කාටවත් පෙන්නන්න බැරිවුණා. එයාලා මට හිනාවුණා.

ඒ වුණාට මට විශ්වාසයි මම දැක්කේ දියකිඳුරියක් කියලා. එයාට ගැහැනු කෙනෙකුගේ මුහුණකුයි මාළුවෙකුගේ වගේ ඇඟකුයි තිබුණා. මම ඒ ගැන අපේ අම්මටයි තාත්තටයි කිව්වා ඒ අයත් මට හිනාවුණා" ක්ලයි දුකෙන් කිව්වා.



"මට මේක අපේ අම්මටයි තාත්තටයි කියනකන් ඉවසිල්ලක් නැහැ මම එයාලට කියන්නම් අපිව එහෙට එක්ක යන්න කියලා" ස්කලී කිව්වා.

ක්ලයිගෙන් සමුගත් ස්කලී පින්කී සහ ලකී සමග නිවසට දිවගියා.

"අම්මා තාත්තා ඔයාල දන්නවද මෙහෙ දියකිඳුරියෝ ඉන්නවා. ක්ලයි දැකලා තියෙනවා" ස්කලී කෑගසමින් කිව්වා.

ක්ලයි ඒ කවුද? තාත්තා ඇසුවා. ක්ලයි කියන්නේ මම වගේම පොඩි පිරිමි ළමයෙක් වෙරළේදි මට මුණගැහුණා. එයා ඉන්නේ මේ ළඟ

ඔයාල දන්නවද? ලස්සනට හඳ පායලා තිබුණ දවසක අර ඈත තියෙන පොඩි දූපත ළග තියෙන ගල්පරය එතනදි තමයි එයා කිදුරියක් දැකලා තියෙන්නේ.

අනේ අපිත් එහෙට යමුකෝ මටත් දියකිඳුරියක් දකින්න ආසයි ස්කලී ඇවිටිලි කළා.

"මේ අහන්න ස්කලී අපි ඔයාව මුහුදු චාරිකාවක් එක්කගෙන යන්නම් ඒත් මේ දියකිඳුරියෝ කියලා කට්ටියක් නැහැ ඒවා මනඃකල්පිත කතා ඔයාගේ යාළුවාට වැරදීමක් වෙන්න ඇති" තාත්තා ආදරයෙන් කිව්වා.

ස්කලී දුකින් කාමරයට ගියා. ඇය සිතුවා දෙමව්පියන් සමග නම් මෙම ගමන යන්න වෙන්නේ නැහැ කියලා. ඇය තදින්ම විශ්වාස කළා කිඳුරියන් ඉන්න බව. ඇය සැලැස්මක් කල්පනා කළා කිඳුරියන් බැලීමට යාමට. ස්කලී තීරණයක් ගත්තා. ඇය සතුටින් නින්දට ගියා.

ඊ ළඟ දිනය උදාවුණා. ස්කලී බල්ලා සහ පූසා සමග වෙරළට ගොස් ක්ලයි එනතුරු බලාසිටියා. ඇය නොඉවසිල්ලෙන් සිටියේ තමාගේ සැලැස්ම ක්ලයිට කියනකම් ක්ලයි පැමිණි පසු ස්කලී ඇයගේ අදහස ක්ලයිට කිව්වා.

"අපේ අම්මලත් මාව විශ්වාස කළේ නැහැ අපි හොරෙන් බෝට්ටුවක් අරගෙන දියකිඳුරියෝ බලන්න යමු. ඔයාට පුළුවන්ද බෝට්ටු පදින්න" ස්කලී ඇසුවා.

"ඔව් මට පුළුවන්, අපේ තාත්තාට බෝට්ටු තියෙනවා. මම එකක් අරගෙන එන්නම් තව දවස් දෙක තුනකින් හොඳින් හදත් පායනවා. මටත් ආයෙත් දියකිඳුරියෝ බලන්න ආසයි" ක්ලයි කිව්වා.

එතැන් පටන් ස්කලී සහ ක්ලයි රහසේ ගමනට සූදානම් වුණා. අවශ්‍ය බඩු සූදානම් කර ගත්තා. අම්මා සහ තාත්තා සිතුවේ ස්කලී දියකිඳුරියන් අමතක කර ඇති බවයි. ඒ දෙදෙනාට සැනසිල්ලක් දැනුණා. ඔවුන් සිතුවේ ස්කලී ක්ලයි සමග සෙල්ලම් කරමින් සිටින බවයි.

නියමිත දිනය උදාවුණා. ස්කලී දෙමව්පියන්ට දන්වා කලින්ම නින්දට ගියා. දෙමව්පියන් නින්දට යනතුරු නොයිවසිල්ලෙන් බලාසිටි ස්කලී බල්ලා සහ පූසා සමග වෙරළට දිවගියා. ස්කලී දුටුවා ක්ලයි බෝට්ටුව ලගටවී සිටිනවා. ස්කලී බල්ලාට සහ පූසාට ඇය එනතුරු නිශ්ශබ්දව වෙරළේ රැදී සිටින ලෙස පවසා ඉක්මනින් බෝට්ටුවට නැංගා.

ඔවුන් ටිකින් ටික ගල්පරය වෙත ළගාවෙමින් සිටියා.

ක්ලයි දක්ෂ ලෙස බෝට්ටුව පදවමින් සිටියා.

නමුත් ටිකවේලාවකින් පරිසරයේ යම් වෙනසක් ඔවුන්ට දැනෙන්න ගත්තා. මුහුදේ තදින් රළ නැගෙන බවත්, සිහින් පොඳ වැස්සකුත්, ඈතින් අහසේ විදුලිකොටන බවත් ඔවුන් දුටුවා. ලස්සනට පායා තිබූ සඳ කොහේද අතුරුදහන් වුණා. ටික ටික වැස්ස තදවුණා. මුහුදු රළ වේගවත් වුණා. ක්ලයිට බෝට්ටුව හසුරුවා ගැනීමට අපහසු වුණා.

කෙසේ හෝ ඔවුන් ගල්පරය ආසන්නයට පැමිණ තිබුණා. එකපාරටම කෙටූ අකුණු පහරේ ආලෝකයෙන් ස්කලී ගල්පරය උඩ දියකිඳුරියක් සිටිනවා දුටුවා.

"ක්ලයි අන්න දියකිඳුරියක් ඉන්නවා" කියමින් ස්කලී කෑගසනවාත් සමඟ ම බෝට්ටුව පෙරළී ගියා.

ස්කලී සහ ක්ලයි අපහසුවෙන් බෝට්ටුවේ එල්ලීගෙන ළග තියෙන දූපත වෙත ගියා. ස්කලී සීතලෙන් ගැහෙමින් "මම දියකිඳුරියක් දැක්කා" "මම දියකිඳුරියක් දැක්කා" කියමින් කෑගැසුවා. " ඒකනේ මම ඔයාට කිව්වේ" ක්ලයි සතුටින් කිව්වා. ඇයට මේ



සිදුවුණු දේ ගැන කිසිම කනගාටුවක් බයක් තිබුණේ නැහැ ඇයගේ බලාපොරොත්තු ඉටුවීම නිසා ඇය සතුටින් සිටියා.

මේ අතර වෙරළේ සිටින ලකීට සහ පින්කීට අනතුරක ඉව වැටුණා. ලකී වෙරළ සහ නිවස අතර දුවමින් හයියෙන් බුරන්නට වුණා. ලකීගේ බිරීමේ සද්දයට අවදිවුන අම්මා සහ තාත්තා මුලින්ම ස්කලීගේ කාමරය වෙත ගියා. එහි ස්කලී නැතිබව දුටු ඔවුන් ඉක්මනින් ලකීගේ බිරීමේ ශබ්දය අනුව වෙරළට දිව ගියා.

ඔවුන්ට දක්නට ලැබුණේ වෙරළ දෙස බලමින් කළබලයෙන් බුරන ලකී ය. දෙමව්පියන්ට සිදුවී ඇති දෙය වැටහුණා.


වහාම ක්‍රියාත්මකවූ දෙමව්පියන් පොලිස් නිළධාරීන් සහ ක්ලයිගේ පියා සමඟ දූපතට ළඟාවන විට වැස්ස නැවතී තිබුණු අතර ස්කලී සහ ක්ලයි සීතලෙන් ගැහෙමින් සිටියා. දෙමව්පියන් දුටු සැනින් ස්කලී " ඒක ඇත්ත එයාල ඉන්නවා මම දියකිඳුරියක් දැක්කා" කියමින් කෑගසමින් ඔවුන් වෙත දිවගියා.

දෙමව්පියන් ඇය වැළඳගත්තා. "ඔව් ඔයා දියකිඳුරියක් දකින්න ඇතියි" තාත්තා පැවසුවා. ක්ලයිගේ පියාද ක්ලයිව වැලඳගත්තා. සියලුදෙනාම ප්‍රවේශමෙන් ගොඩබිමට පැමිණියා.

පසුදින උදාවුණා. දෙමවුපියන් නිවාඩුව අවලංගු කර නිවසට යාමට කටයුතු සූදානම් කළා.

මේ සිදුවුණ දෙයින් ඔවුන් තදින්ම කැළඹීමෙන් සිටියා. ඇය එයට විරුද්ධවීමට සිතුවේ නැහැ ඇයට ඇයගේ ක්‍රියාවේ බරපතළකම මේවන විටත් අවබෝධවී සිටි අතර ඊටත් වඩා ඇයගේ බලාපොරොත්තු ඉටුවීම නිසා ඇය සතුටින් සිටියා.

පිටත්වන මොහොතේ ස්කලී දුකින් ක්ලයිගෙන් සමුගත්තා. ක්ලයි ස්කලීට ඇයව මතක්වීමට සිප්පුකටු වලින් සෑදූ ලස්සන මාලයක් තෑගි කළා. ස්කලී ඇය සතු ලස්සන පින්තූර පොතක් ක්ලයිට තෑගි කළා. එසේම ඔහු තවත් වැඩුණු පසු දියකිඳුරියන් ගැන සොයා බලා ස්කලීට දන්වන බවටත් පොරොන්දු වුණා. පින්කී සහ ලකීද ක්ලයිගෙන් දුකින් සමුගත්තා.



සියලු දෙනාම නැවත තමන්ගේ නිවසට පැමිණියා. අම්මාට සහ තාත්තාට ස්කලී සමග කාලය ගත කළේ නැති එක ගැන ලොකු පසුතැවීමක් තිබුණා.

මේ ගමනෙන් සිදුවුන තවත් හොඳ දෙයක් තමයි අම්මා සහ තාත්තා ස්කලී සමග කාලය ගත කිරීමට කෙසේ හෝ වේලාව වෙන්කරවා ගැනීම.

දරුවන් ගැන දෙමව්පියන් මීට වඩා සැලකිලිමත් විය යුතු බවත්, දරුවන්ව තමන් විශ්වාස කරන බව ඔවුන්ට ඇගවිය යුතු බවත්, අම්මාට සහ තාත්තාට පොලීසියෙන් අවවාද කර තිබුණා.

ඒ වගේම ස්කලී දියකිඳුරියන් ගැන මීට වඩා හොද අධ්‍යනයක් කිරීමටත් අනාගතයේ දිනයක ඔවුන් දැකගැනීමට අවශ්‍ය කටයුතු කිරීමටත් සිතා ගත්තා.

සමාප්තයි

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්